# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120 2171635

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1486/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 19/09/2024
පැය 0930

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - මිදිගම පොලිස් වසම.**

2024.09.19 වන අද දින උදෑසන කාලයේ මිදිගම පොලිස් වසමේ ගොවියාපාන ප්‍රදේශයේ පිහිටි මාළු වෙලෙඳ සැලක සිටි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පලා ගොස් ඇති බවට මිදිගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

වෙඩි වැදීමෙන් බරපතල තුවාල ලැබූ වෙළෙඳ සැලේ හිමිකරු සහ වෙළෙඳ සැලට පැමිණ සිටි දෙදෙනෙකු තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මාළු වෙළෙඳ සැලේ හිමිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ගොවියාපාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘතශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙම ඝාතනය විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ ක්‍රියාවක් බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී නිරීක්ෂණය වී ඇති අතර, සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මිදිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**